# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## 16 x 1.5 වර්ග මි.මී. සන්නාහ භූගත කේබල් (Armoured Underground Cables) මීටර 15,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය - IFB අංක SRS F. 7885**

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට 16 x 1.5 වර්ග මිමී සන්නාහ භූගත කේබල් (16x1.5 Armoured Underground Cables) මීටර 15,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින් / සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු භාරගනු ලැබේ.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. අභිලාෂී ලංසුකරුවන්ට 2022.11.04 දින සිට 2022.11.29 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප. ව. 3.00 ත් අතර වැඩිමනත් තොරතුරු ලබා ගැනීමටත් පහත සඳහන් ලිපිනයේදී ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ - 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11)2438078 හෝ 94(11)2436818** |
| **ෆැක්ස්** | : | **94(11)2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. ලංසුකරුවන්ට සන්නාහ භූගත කේබල් සැපයීමට තමන්ට හැකියාව ඇති බවට ලේඛනමය සාක්ෂි, ඉහත කේබල් සැපයීම පිළිබඳ පසුගිය වාර්තා / ලේඛන (පසුගිය වසර 5 තුළ එකම සන්නාමය සහිත කේබල් අලෙවි කළ ගනුදෙනුකරුවන් අඩු තරමින් 10 දෙනෙකු පිළිබඳ) සමග ඉදිරිපත් කළ යුතුය. නැතහොත් විවිධ මධ්‍යය සංඛ්‍යාවන් පිළිබඳව කාර්ය සාධන සහතික සමග තහවුරු කළ යුතුය.

නිෂ්පාදකයින් හට අයිතමය සැලසුම් කිරීම හා නිෂ්පාදනය සඳහා ISO9001 : 2008 තත්ත්ව ප්‍රශස්තතා සහතිකය හිමිව තිබිය යුතු අතර, සන්නාහ භූගත කේබල් නිෂ්පාදනය / සැපයීම පිළිබඳ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බැව් සනාථ කිරීමට ලේඛනමය සාක්ෂි ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

05. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව කාර්යාලය යන ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 11,500/- ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට 2022.11.04 දින සිට 2022.11.29 දින ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

06. සෑම ලංසුවක් සමගම ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 450,000.00 ක් විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

07. ලංසු 2022.11.30 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද ලංසු භාර ගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F.7885**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**